# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
☏ +94112785141-50 Fax +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk


මගේ අංකය / எனது இல. / My Ref. } ED/1/27/15/01/2022 ඔබේ අංකය / உமது இல. / Your Ref. } දිනය / திகதி / Date } 2022.04.5

සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත,

**<u>2022 ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම</u>**

01. වාර්ෂික ගුරු ස්ථාන මාරු 2022 යටතේ ජාතික පාසල් වල ගුරුභවතුන්ගේ ස්ථාන මාරු සඳහා මාර්ගගත ක්‍රමවේදයට අයදුම්පත් කැඳවීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත. මෙම අවස්ථාවේ ඉහත සඳහන් ක්‍රමවේදය ඔස්සේ ගුරු ස්ථාන මාරු වීම් ක්‍රියාත්මක කිරීමට අදාළව පහත උපදෙස් සංග්‍රහය පිළිබඳ අවධානය යොමු කළ යුතුය. ඒ අනුව, මෙම ස්ථාන මාරුවීම් ප්‍රධාන කාණ්ඩ 02කින් සමන්විත වේ.

**1.1 <u>පළමු කාණ්ඩය</u>**

**<u>දැනට සිටින ජාතික පාසලේ සේවා කාලය වර්ෂ 10 සම්පූර්ණ කළ ගුරුභවතුන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන අනිවාර්ය ස්ථාන මාරු.</u>**

- <u>2021.12.31 දිනට හෝ ඊට පෙර දැනට සේවය කරන පාසලේ සේවා කාලය වර්ෂ 10 සම්පූර්ණ කරන ගුරුභවතුන් වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලියට අනිවාර්යයෙන් ම යටත් වේ. එම ගුරුභවතුන් සියලු දෙනාම https://nstt.moe.gov.lk දිගුව ඔස්සේ මාර්ගගතව ගුරු ස්ථාන මාරු අයදුම්පත යොමු කර එහි මුද්‍රිත පිටපතක් ලබා ගෙන එය විදුහල්පති වෙත භාර දිය යුතුය.</u> **මාර්ගගතව අයදුම්පත් යොමු කළ හැකි කාලසීමාව 2022/04/17 දින සිට 2022/04/30 දින දක්වා වේ.**

- පෞද්ගලික අවශ්‍යතාවයන් හේතුවෙන් ලබාගත් තාවකාලික අනුයුක්තවීම්, පෞද්ගලික අවශ්‍යතා හේතුවෙන් ලබාගත් දේශීය/ විදේශීය වැටුප් සහිත/ රහිත නිවාඩු ආදිය ද වැටුප් ලබන පාසලේ සේවාකාලයට ඇතුළත් ලෙස ගණන් බලනු ලැබේ.

- **සේවා කාලය වර්ෂ 10 සම්පූර්ණ කළ සියලුම ගුරුභවතුන්ගේ සම්පූර්ණ කරන ලද** <u>ස්ථාන මාරු සඳහා වන අයදුම්පත් සමඟ ගුරුභවතුන්ගේ නාමලේඛනය මේ සමඟ ඇති **TTB/2022** ආකෘතියේ සඳහන් කළ යුතුය.</u>

- **<u>වර්ෂ 10 සේවාකාලය සම්පූර්ණ වීම හේතුවෙන් ස්ථාන මාරු ලැබීමට යටත් වුවද කිසියම් ගුරුභවතෙක් නියමිත දිනට අදාළ අයදුම්පත්‍රය සම්පූර්ණ කර විදුහල්පතිවරයාට භාර නොදෙන්නේ නම් TTB/10/2022 උපලේඛනයෙහි ඔවුන්ගේ නම් හා විදුහල්පති නිර්දේශය ඇතුළත් කර එවිය යුතුය. මෙම තොරතුරු මත එම ගුරුභවතුන් හට ස්ථාන මාරු ලබා දීම ගුරු මාරු මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.</u>**

**1.2** <u>දෙවන කාණ්ඩය - වාර්ෂික ස්ථාන මාරු</u>

- පළමු කාණ්ඩයට එනම් <u>අනිවාර්ය ස්ථාන මාරුවීම් වලට යටත් නොවන එකම පාසලේ සේවාකාලය වසර 10 ට අඩු ගුරුභවතුන්ට ද</u> තම ස්ථාන මාරු ඉල්ලීම් ඉදිරිපත් කළ හැකිය. එම ගුරුභවතුන් ද https://nstt.moe.gov.lk දිගුව ඔස්සේ අයදුම්පත මාර්ගගතව සම්පූර්ණ කර යොමු කළ යුතුය. එහි මුද්‍රිත පිටපතක් ලබාගෙන විදුහල්පති වෙත භාර දිය යුතුය. **මාර්ගගතව අයදුම්පත් යොමු කළ හැකි කාලසීමාව 2022/04/17 දින සිට 2022/04/30 දින දක්වා වේ.**

- එම සියලු අයදුම්පත් ගුරුභවතුන්ගේ නාමලේඛනය **<u>TTB/2022</u>** ආකෘතියේ සඳහන් කළ යුතුය.

- <u>මාර්ගගතව යොමු කළ ගුරු ස්ථාන මාරු අයදුම්පත හැරුණු විට වෙනත් ආකෘති මඟින් හෝ පුද්ගලිකව අයදුම්පත් අමාත්‍යාංශයට නොඑවීමට,</u> විදුහල්පතිවරුන් විසින් වගබලාගත යුතු වේ.

**02.** ගුරු ස්ථාන මාරු අයදුම්පත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමේ දී විදුහල්පතිවරුන් විසින් පහත උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.

1. අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පෙර මාර්ගගතව අයදුම්පත් යොමු කිරීමට ගුරුභවතුන් දැනුවත් කිරීම හා අන්තර්ජාල පරිගණක පහසුකම් ලබා දීම හා තමා විසින්ම මුද්‍රිත පිටපත අත්සන් කර විදුහල්පති වෙත භාර දිය යුතු බවට දැනුවත් කළ යුතුය.

2. ස්ථාන මාරු ඉල්ලීම් සඳහා වන අයදුම්පත් එවීමේ දී **<u>උපදෙස් පත්‍රිකාවේ සඳහන් කර ඇති අතිරේක ලියවිලි වන;</u>**

(i) ගුරුවරයාගේ පත්වීම් ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත,
(ii) වර්තමාන සේවා ස්ථානයට ස්ථාන මාරු ලැබූ ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත,
(iii) ඉගැන්වීම් කරන කාලසටහනේ විදුහල්පති සහතික කළ පිටපත,

අමුණා ඇති බවට තහවුරු කරගෙන අයදුම්පත් අමාත්‍යාංශයට එවීමට විදුහල්පතිවරුන් විසින් වග බලා ගත යුතුය.

**03.** විදුහල්පති විසින් වසර 10 සම්පූර්ණ කළ ගුරුභවතුන්ගේ හා වාර්ෂික ස්ථාන මාරු අයදුම් කරන සෙසු ගුරුභවතුන්ගේ තම අත්සන යෙදා විදුහල්පති වෙත ඉදිරිපත් කළ අයදුම්පත් හි විදුහල්පති විසින් සම්පූර්ණ කළ යුතු කොටස් පැහැදිලිව සම්පූර්ණ කර උපලේඛනය ද සමඟ එකවර අධ්‍යාපන අමාත්‍යාංශයට එවිය යුතුය.

**04.** විදුහල්පතිවරුන් විසින් සම්පූර්ණ කර අයදුම්පත් සමඟ එවිය යුතු උපලේඛන.

(i) **TTB/2022** උපලේඛනය - අයදුම්පත් යොමු කරනු ලබන සියලුම ගුරුභවතුන්ගේ තොරතුරු ඇතුළත් කළ යුතුය. ඔවුන් තම පාසලේ 2021.12.31 දිනට සේවා කාලය, විශ්‍රාම ගන්නා දිනය, දැනට නිවාඩු ලබා ඇත්නම් ඒ කුමක් සඳහාද යන්න, ප්‍රාථමික අංශයේ උගන්වන ගුරුභවතෙකු නම් උගන්වන ශ්‍රේණිය පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

(ii) **TTB/10/2022** උපලේඛනය - **<u>තම පාසලේ සේවය කරනු ලබන වසර 10ට වැඩි සේවා කාලයක් සහිත අයදුම්පත් යොමු කළ හා නොකළ සියලුම ගුරුභවතුන්ගේ</u>** නම, 2021.12.31 දිනට තම පාසලේ සේවා කාලය හා තම නිර්දේශය පැහැදිලිව ඇතුළත් කර එවිය යුතුය. **<u>විදුහල්පති නිර්දේශය මත අයදුම්පත් යොමු නොකළ ගුරුභවතුන්හටද ස්ථාන මාරු මණ්ඩලය මඟින් ස්ථාන මාරු ලබා දෙනු ඇත.</u>**

**05.** 2022 ගුරු ස්ථාන මාරු සම්බන්ධව **<u>ගුරුභවතුන් සඳහා වන උපදෙස් සංග්‍රහය</u> මේ සමග එවනු ලබන අතර, එය ඔබ පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතුය. (මේ පිළිබඳව ගුරු මණ්ඩලය දැනුවත් කර ලොග් සටහනක් තැබිය යුතුය. )**

**06.** <u>**සියලු අයදුම්පත් 2022/05/20** දිනට පෙර **අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව, පළමු මහල, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල** යන ලිපිනයට යොමු කළ යුතු අතර</u> අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **<u>2022/05/20 දිනට පසුව ලබා දෙන අයදුම්පත් පිළිබඳව ඇතිවන ගැටළු සඳහා විදුහල්පති වගකිව යුතු වේ.</u>**

**07.** යම් ගුරු භවතෙකු **<u>පළාත් පාසල් ඉල්ලුම් කරන්නේ නම්, අයදුම්පත් කට්ටල 04ක්</u>** ඉදිරිපත් කළ යුතුය.

**08.** ඉහත කරුණු සම්බන්ධයෙන් යම් ගැටළුවක් පවතී නම් 011-2784434 දුරකතන අංකයට හෝ <u>director.tt@emis.moe.gov.lk</u> ඊ මේල් ලිපිනය ඔස්සේ දැනුම් දිය හැක.

**මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා**
**ලේකම්**
අධ්‍යාපන අමාත්‍යාංශය

# ජාතික පාසල් ගුරුභවතුන්ගේ ස්ථාන මාරු අයදුම්පත පිරවීම සඳහා උපදෙස්

අයදුම්පත පිරවීමේ දී පහත පියවරයන් අනුගමනය කරන්න.

## අයදුම්පත පිරවීමේදී අනුගමනය කළ යුතු පොදු කොන්දේසි

- **අයදුම්පත පිරවීමට පෙර පහත සඳහන් උපදෙස් හොඳින් කියවා අවබෝධ කර ගත යුතුය.**
- **වර්තමාන පාසලේ සේවා කාලය වසර 10ට වැඩි නම් අනිවාර්යයෙන් ස්ථාන මාරු අයදුම් කළ යුතුය.**
- **අයදුම්පත ගුරුභවතා විසින්ම සම්පූර්ණ කළ යුතු අතර ඒ සඳහා බාහිර පාර්ශවයන් සම්බන්ධ කර නොගත යුතුය.**
- **අයදුම්පත යොමු කළ (Submit) කළ පසු නැවත සංශෝධන සිදු කළ නොහැකි බැවින් නිවැරදිභාවය තහවුරු කර ගත් පසු අයදුම්පත යොමු කළ (Submit) කළ යුතුය.**

**1.** අයදුම්පත පිරවීමට පෙර ඔබගේ මාධ්‍යය අනුව උපදෙස් පත්‍රිකාව තෝරා ගෙන හොඳින් කියවා අවබෝධ කර ගන්න. අනතුරුව තිරයේ දිස්වන ■ **I have read and understood the guidelines above** හි හිස් කොටුව මත Click කරන්න.

**2.** ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව ඇතුළත් කර අදාළ අයදුම්පත්‍රය ලබාගන්න. (ඔබගේ වර්තමාන හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න. ඉදිරියට යා නොහැකි නම්, ඔබගේ පැරණි හැඳුනුම්පත් අංකය ඇතුළත් කර නැවත උත්සාහ කරන්න.) එවිට මාර්ගගත ස්ථාන මාරු අයදුම්පත විවෘත වේ.

**3.** ඒ අනුව මාර්ගගත ගුරු ස්ථාන මාරු අයදුම්පත්‍රය පිරවීමේදී පහත උපදෙස් අනුගමනය කරන්න.

**අයදුම්පතෙහි අංක 1 සිට 7 දක්වා (Basic Information)**

**4.** ඔබගේ පෞද්ගලික තොරතුරු නිවැරදි ද යන්න පරීක්ෂා කරන්න. කිසියම් සංශෝධනයක් කිරීමට අවශ්‍ය නම්, ඉදිරියේ ඇති තැඹිලි පැහැ Edit බොත්තම මත click කර නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට හෝ තේරීමට කටයුතු කරන්න.

**5.** අනු අංක 3.2 හි ඔබගේ භාෂා මාධ්‍යය අනුව මුලකුරු සමග නම ඇතුළත් කරන්න. (උදා:- ඒ.බී.සී. පෙරේරා)

**6.** අනු අංක 05 හි දත්ත නිවැරදිව ඇතුළත් කළ විට අනු අංක 5.1 ස්වයංක්‍රීයව සම්පූර්ණ වනු ඇත.

**අයදුම්පතෙහි අංක 8 සිට 12 දක්වා (Service information)**

**7.** ඔබගේ සේවා තොරතුරු නිවැරදි ද යන්න පරීක්ෂා කරන්න. කිසියම් සංශෝධනයක් කිරීමට අවශ්‍ය නම්, එම තොරතුරු ඉදිරියේ ඇති තැඹිලි පැහැ Edit බොත්තම මත click කර, ඔබගේ නිවැරදි සේවා තොරතුරු ඇතුළත් කිරීමට හෝ තේරීමට කටයුතු කරන්න.

**8.** වර්තමානයේ තාවකාලික අනුයුක්තයක් ලබා වෙනත් පාසලක හෝ ආයතනයක සේවය කරන්නේ නම්, අනු අංක 9 ඉදිරියේ ඇති කොටුව මත click කර, ඊට අදාළ තොරතුරු දිස්වූ පසු, තම තොරතුරු ඇතුළත් කරන්න.

**9.** අනු අංක 10.1 හි දත්ත නිවැරදිව ඇතුළත් කළ විට අංක 10.2 ස්වයංක්‍රීයව සම්පූර්ණ වනු ඇත.

**10.** අනු අංක 11.1 හි දත්ත නිවැරදිව ඇතුළත් කළ විට අංක 11.2 ස්වයංක්‍රීයව සම්පූර්ණ වනු ඇත.

**11.** අංක 12 හි ඔබට සේවා ස්ථානයක් එකතු කිරීමට අවශ්‍ය නම්, අදාළ තොරතුරු ඇතුළත් කර **Add row** මත click කරන්න.

**12.** අංක 12 හි ස්වයංක්‍රීයව දිස්වන තොරතුරක් වෙනස් විය යුතු නම්, අයදුම්පත අවසානයේ ඇති අංක 20 හි නිවැරදි විය යුතු ආකාරය සටහන් කරන්න.

**අයදුම්පතෙහි අංක 13 සිට 17 දක්වා (Subject Information)**

**13.** අංක 13 හි ඔබගේ පත්වීම් විෂයය සම්බන්ධ තොරතුරු නිවැරදි ද යන්න පරීක්ෂා කරන්න. කිසියම් සංශෝධනයක් කිරීමට අවශ්‍ය නම්, එම තොරතුරු ඉදිරියේ ඇති තැඹිලි පැහැ Edit බොත්තම මත click කර ඔබගේ නිවැරදි විෂයය තොරතුරු තෝරන්න.

**14.** අංක 14 හි ඔබ පාසලෙහි දැනට ඉගැන්වීම් කරන විෂයය සම්බන්ධ තොරතුරු තේරීම සිදු කරන්න.

**15.** අංක 15 හා 16 හි සියලු කොටස් සඳහා පිළිතුරු ඇතුළත් කිරීම හෝ තේරීම සිදු කරන්න.

**16.** අංක 17 සඳහා පත්වීම් විෂයය හා ඉගැන්වීම් විෂයය හැර වෙනත් විෂයයක් ඉගැන්වීමට හැකියාව පවතී නම් එය තේරීම සිදු කරන්න.

**17.** ඔබ ඇතුළත් කරන විෂයයන්ට අදාළ මාධ්‍යය නිවැරදිව ඇතුළත් කිරීමට සැලකිලිමත් වන්න.

**18.** ඔබ ප්‍රාථමික අංශයේ ගුරුභවතෙකු නම්, අනු අංක 14.1 හි **Primary** Select කළ පසු 14.4 **Grade** හි ඔබ 2022 අධ්‍යයන වර්ෂයේ ඉගැන්වීම් කරන ශ්‍රේණිය තෝරා ගත යුතුය.

**අයදුම්පතෙහි අංක 18 සිට 20 දක්වා (Transfer Request)**

**19.** අංක 18 හි ඔබ ස්ථාන මාරු අපේක්ෂා කරන ස්ථාන මාරු වර්ග 03න් 01ක් තෝරා ගන්න. එය පහත පරිදි වේ.

**19.1.** ජාතික පාසලකින් ජාතික පාසලකට ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නම්,

**19.1.1.** අදාළ බොත්තම Click කළ පසු ස්ථාන මාරු අපේක්ෂා කරනු ලබන පාසල් 05ක් නම් කිරීමට අවස්ථාව හිමි වේ. පාසල් 03ක් ඇතුළත් කිරීම අනිවාර්යය වේ. (පාසලේ නම Search කිරීමෙන් පාසල තෝරා ගත හැකිය.) ස්ථාන මාරු ලබා දීමේදී ඉල්ලා ඇති පාසල් අනුපිළිවෙලට සලකා බලනු ලැබේ.

**19.2.** ජාතික පාසලකින් පළාත් පාසලකට ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ නම්,

**19.2.1.** අදාළ බොත්තම Click කළ පසු ස්ථාන මාරු අපේක්ෂා කරනු ලබන පළාත හා එම පළාතේ අදාල පළාත් පාසල ඇතුළත් කරන්න. පළාත හා ඉල්ලුම් කරන පාසල නම් කිරීමට අවස්ථා 05 හිමි වේ. (පාසලේ නම Search කිරීමෙන් පාසල තෝරා ගත හැකිය.) පාසල් 03ක් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. ස්ථාන මාරු ලබා දෙන පාසල අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබයි.

**19.3.** ජාතික පාසලකින් ජාතික පාසලකට හෝ ජාතික පාසලකින් පළාත් පාසලකට යන අවස්ථා දෙකම අපේක්ෂා කරන ගුරුභවතෙකු නම්,

**19.3.1.** අදාළ බොත්තම Click කළ පසු ස්ථාන මාරු අපේක්ෂා කරනු ලබන ජාතික පාසල් 05ක් හා පළාත් පාසල් 05ක් නම් කිරීමට අවස්ථාව හිමි වේ. (පාසලේ නම Search කිරීමෙන් පාසල තෝරා ගත හැකිය.) ජාතික පාසල් 03ක් හා පළාත් පාසල් 03ක් ඇතුළත් කිරීම අනිවාර්ය වේ. ස්ථාන මාරු ලබා දීමේදී ජාතික පාසල් සඳහා ප්‍රමුඛතාවය ලබා

දෙන අතර ඉල්ලා ඇති පාසල් අනුපිළිවෙලට සලකා බලනු ලැබේ. පළාත් පාසල් ලබා දීම අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබයි.

**20.** අංක 19න් ඔබ ස්ථාන මාරු වීමට හේතුව නිවැරදිව තෝරා ගන්න.

**21.** අංක 20හි අයදුම්පතෙහි ඔබ ලබා දුන් තොරතුරුවලට වඩා වැඩි යමක් ඇතුළත් කිරීමට ඇත්නම් එය ඉතා කෙටියෙන් සඳහන් කරන්න. මේ සඳහා ඔබට පහසු භාෂා මාධ්‍යයක් තෝරා ගත හැක. එසේම අංක 12 හි ස්වයංක්‍රීයව දිස්වන සේවා විස්තර වල සංශෝධන ඇත්නම් මෙහි සඳහන් කළ යුතුය.

**22.** ඔබ ලබා දුන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සඳහන් කර අදාළ කොටුව Click කළ පසු අයදුම්පත යොමු කළ (Submit) කළ හැකිය.

**23.** අනතුරුව **Your Teacher Transfer Application Successfully Submitted** යන්න දිස්වූ පසු පහළින් පෙන්නුම් කරන **Download Application** යන්න Click කර ඔබගේ අයදුම්පත බාගත කළ හැක.

**24.** එම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් ලබා ගෙන එහි අංක 19හි දිනය සහ අත්සන යොදා පාසලේ විදුහල්පති වෙත තමා විසින්ම අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනට පෙර භාර දිය යුතුය. මේ සමග ඇමුණා එවිය යුතු ලිපි ලේඛන පහත පරිදි වේ.

i. පත්වීම් ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත

ii. අවසන් වරට ඔබ වෙත නිකුත් කර ඇති ස්ථාන මාරු ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත

iii. කාලසටහනේ විදුහල්පති සහතික කළ පිටපත

**සැ.යු. - ස්ථාන මාරු අපේක්ෂා කරනු ලබන්නේ ජාතික පාසලකින් ජාතික පාසලකට නම් ඉහත ලේඛන ඇතුළත් එක් අයදුම්පත් කට්ටලයක්ද;**

**ස්ථාන මාරු මාරු අපේක්ෂා කරනු ලබන්නේ ජාතික පාසලකින් පළාත් සභා පාසලකට නම් ඉහත ලේඛන ඇතුළත් අයදුම්පත් කට්ටල 04ක් ද; විදුහල්පති වෙත භාර දිය යුතුය.**

**25.** පොදු කරුණු -

- අයදුම්පත පුරවා යොමු කළ (Submit) හැක්කේ එක් වරක් පමණි.
- අයදුම්පත යොමු කළ (Submit) පසු ලබා ගන්නා මුද්‍රිත පිටපත අනුව යම් තොරතුරක වරදක් දිස් වන්නේ නම් එය මුද්‍රිත පිටපතේ නිවැරදි කර කෙටි අත්සනක් යොදා විදුහල්පති වෙත භාර දෙන්න.
- අයදුම්පත පිරවීමේදී ඉහත කරුණු වලට අමතරව යම් ගැටළුවක් පවතී නම් ඔබගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය, වැටුප් ලබන පාසලේ නම හා ලිපිනය, පුද්ගලික දුරකතන අංකය හා ගැටළුව director.tt@emis.moe.gov.lk ඊ මේල් ලිපිනයට යොමු කරන්න. (ඊ මේල් එකෙහි SUBJECT සඳහා ඔබගේ වැටුප් ලබන පාසල අයත් දිස්ත්‍රික්කය සඳහන් කරන්න.) නැතහොත් 011 – 2784434 දුරකතන අංකයට දැනුම් දිය හැක.

**මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා**
**ලේකම්**
අධ්‍යාපන අමාත්‍යාංශය